# ව්‍යවසායකත්වය

**“පාරිසරික අවස්ථා නිර්මාණශීලිව උකහා ගනිමින් මිනිස් අවශ්‍යතා වෙනුවෙන් වුවමනා තෘප්තිමත් කිරීමට අවධානම් දරමින් නවෝත්පාදනයේ යෙදීම” ව්‍යවසායකත්වය ලෙස හඳුන්වයි.**

ව්‍යවසායකත්ව කටයුත්ත සිදු කරන්නා “ව්‍යවසායකයා” ලෙස හඳුන්වයි. එනම් පරිසර අවස්ථා නිර්මාණශීලිව උකහාගෙන අවධානම් දරමින් නවෝත්පාදනයේ යෙදෙන පුද්ගලයා ව්‍යවසායකයෙකි.

ව්‍යවසායකයාගේ කාර්යභාරය

- ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම හා ප්‍රයෝජනයට ගැනීම.
- නිෂ්පාදන සාධක සංයෝග කරමින් නිෂ්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම.
- නව්‍යතා සම්පාදනය
- අවධානම් දැරීම

ව්‍යවසායකත්වයේ වැදගත්කම

1. වේගයෙන් වෙනස්වන ලෝකයේ වෙනස්වීම් වලට ප්‍රතික්‍රියා දැක්විය හැකි, නව්‍යතා සෙවිය හැකි ව්‍යවසායකයින්ගේ දැඩි අවශ්‍යතාවක් පැවතීම.
2. තරඟකාරී ව්‍යාපාරික ලෝකය තුළ රැඳී සිටීම සඳහා නව්‍යතා බිහිකිරීමේ අවශ්‍යතාව.
3. වෙනස්වන ලෝකයට නායකත්වය දිය හැක්කේ ව්‍යවසායකයින්ට බැවින් සෑම සංවිධානයකටම ව්‍යවසායකයින් අවශ්‍ය වීම.
4. නවෝත්පාදන තුළින් බිහිවන නව භාණ්ඩ හා සේවා තුළින් මිනිසාගේ ජීවන තත්වය උසස් කල හැකි වීම.
5. පවතින සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීමට විවිධාංගිකරණයෙන් යුත් ව්‍යාපාර ඇති කිරීමේ අවශ්‍යතාව.
6. වේගවත් ලෙස වෙනස්වන ව්‍යාපාර පරිසරය තුළ සාර්ථකව ව්‍යාපාර පවත්වාගෙන යාමේ අවශ්‍යතාව.
7. නව ව්‍යාපාර හරහා නව රැකියා අවස්ථා බිහි කල හැකි වීම.
8. ආර්ථික වර්ධනය වේගවත් කරගැනීමට භාණ්ඩ හා සේවා වැඩි වශයෙන් නිපදවීමේ අවශ්‍යතාව.
9. ආර්ථික සංවර්ධනය සහ තිරසාර සංවර්ධනය උදා කරගැනීමේ අවශ්‍යතාව.

ව්‍යවසායකත්වය සහ ව්‍යාපාර අතර ඇති සම්බන්ධතාවය

මිනිස් අවශ්‍යතා වෙනුවෙන් වුවමනා තෘප්තිමත් කිරීම සඳහා අවධානම් දරමින් නවෝත්පාදනය කිරීම ව්‍යවසායකත්වයයි.

මිනිස් අවශ්‍යතා සහ වුවමනා තෘප්තිමත් කිරීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම, අලෙවිය හා අනුබද්ධ සියලු කටයුතු ව්‍යාපාර ලෙස හඳුන්වයි.

එනම් ව්‍යවසායකත්වය මෙන්ම ව්‍යාපාරද මිනිස් අවශ්‍යතා සහ වුවමනා තෘප්තිමත් කිරීම මත පදනම්ව ඇත. මෙහිදී ව්‍යවසායකත්වය විසින් ව්‍යාපාර කාර්යයන්ට අමතරව ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම, අවධානම් දැරීම, නවෝත්පාදනය වැනි කාර්යයන් කිහිපයක් සිදු කරයි. එනම් ව්‍යාපාර සාර්ථක කරගැනීමට අවශ්‍ය කටයුතු ව්‍යවසායකත්වය විසින් ඉටු කරයි. මේ අනුව සියලු ව්‍යාපාර, ව්‍යවසායන් නොවන බවත් ව්‍යවසායකත්වයේ අවසාන ප්‍රතිඵලය ව්‍යාපාර බවත් පැහැදිලිය.

## ව්‍යවසායකත්ව ප්‍රතිලාභ

ව්‍යවසායකත්ව ප්‍රතිලාභ ප්‍රධාන අංශ 3ක් යටතේ හඳුනා ගත හැකිය.

| පුද්ගල ප්‍රතිලාභ | අයතනික ප්‍රතිලාභ | සමාජයීය ප්‍රතිලාභ |
|---|---|---|
| 1. පුද්ගල හැකියා උපරිම අයුරින් යොදාගත හැකිවීම.<br>2. ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලැබිය හැකිය.<br>3. සමාජ තත්වය/ පිළිගැනීම ඇතිවීම.<br>4. ඉහළ ජීවන මට්ටමක් ගතකල හැකිවීම.<br>5. පෞද්ගලික මුල්‍යමය ලාභ ලැබිය හැකිවීම.<br>6. මානසික තෘප්තිය<br>7. නිදහස් තීරණ ගැනීමට හැකිවීම.<br>8. තම නිර්මාණශිලිත්වය ප්‍රදර්ශනය කළහැකි වීම. | 1. ව්‍යාපාර කටයුතු පුළුල් කරගත හැකිවීම.<br>2. තරඟකාරිත්වයට පහසුවෙන් මුහුණදිය හැකිවීම.<br>3. ව්‍යාපාර පැවැත්ම තහවුරු වීම.<br>4. ලාභදායිත්වය වර්ධනය කරගත හැකිවීම.<br>5. කර්මාන්තය තුළ ප්‍රමුඛයන් බවට පත්විය හැකිවීම.<br>6. රජයේ ඇගයීමට ලක්වීම.<br>7. ආයතනය අඛණ්ඩව වර්ධනය වීම. | 1. නව රැකියා අවස්ථා<br>2. නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථාව ලැබීම.<br>3. ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම.<br>4. ජනතාවගේ ජීවන තත්වය ඉහළ යාම.<br>5. නව වෙළඳපලවල් සංවර්ධනය වීම.<br>6. ජාතික නිෂ්පාදිතය ඉහළ යාම තුළින් ආර්ථික වර්ධනයක් ඇති වීම.<br>7. සාධාරණ තරඟකාරිත්වයක් නිර්මාණය වීම. |

## ව්‍යවසායකත්වය සහ ආර්ථික සංවර්ධනය

රටක කෙතරම් භෞතික හා මානව සම්පත් පැවතියත් ව්‍යවසායකත්වය නොමැති නම් එහි ආර්ථික සංවර්ධනයක් දැකිය නොහැකිය. ආර්ථික සංවර්ධනය යන්ත්‍රයක් ලෙස සැලකුවහොත් එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉන්ධන ව්‍යවසායකත්වයයි. එහිදී ව්‍යවසායකත්වය තුළින්,

1. නව නිෂ්පාදන බිහිවීම තුළින් වෙළඳපල ප්‍රසාරණය වීම.
2. රටෙහි ප්‍රයෝජනයට නොගත් සම්පත් ඵලදායි නිෂ්පාදන අංශ වෙත යොමු කිරීම.
3. ප්‍රාදේශීය සම්පත් භාවිතය නිසා ඒවාට ඉහළ ඉල්ලුමක් ඇතිවීම.
4. නව ව්‍යාපාර බිහිවීම.
5. මහා පරිමාණ කර්මාන්ත වලට අවශ්‍ය අමුද්‍රව්‍ය බිහිකිරීම.
6. නවෝත්පාදනය නිසා ජනතාවගේ ජීවන තත්වය ඉහළ යාම.
7. සම්ප්‍රදායික නිෂ්පාදන ශිල්පක්‍රම ආරක්ෂා වීම.
8. නව්‍යතා බිහිකිරීම තුළින් ජාතික නිෂ්පාදිතය ඉහළ යාම.
9. නව රැකියා අවස්ථා බිහිවීම තුළින් සේවා නියුක්තිය ඉහළ යාම.

නව රැකියා අවස්ථා → අදායම් මට්ටම ඉහළ යාම → ක්‍රයශක්තිය වැඩි වීම → භාණ්ඩ සේවා සඳහා ඉල්ලුම වැඩිවීම → නිෂ්පාදනය වැඩි වීම → නව රැකියා අවස්ථා

<u>ව්‍යවසායකත්ව ප්‍රවණතා</u>

1) <u>අභ්‍යන්තර ව්‍යවසායකත්වය</u>
ව්‍යාපාර සංවිධාන වල සේවකයන්ගේ නිර්මාණශීලිත්වය තුළින් බිහිකෙරෙන ව්‍යවසායකත්වය අභ්‍යන්තර ව්‍යවසායකත්වයයි. සංවිධාන වල විවිධ තනතුරුවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයන් එම ආයතන වල නිෂ්පාදිත හා නිෂ්පාදිත ක්‍රමවල වෙනස්කම් සිදු කරයි. එනම් ආයතනයක් තුළ ක්‍රියාත්මක වන ව්‍යවසායකත්වය අභ්‍යන්තර ව්‍යවසායකත්වයයි.

2) <u>හරිත ව්‍යවසායකත්වය</u>
පාරිසරික හෝ සමාජීය ගැටළු හෝ අවශ්‍යතා සඳහා ඉතා ඉහළ අවදානමකින් යුතුව ස්වභාවික පරිසරයට ධනාත්මක බලපෑමක් ඇති කිරීමට අවශ්‍ය දැනුවත්භාවයකින් සිදු කරන ව්‍යවසායකත්ව කටයුතු ය.

3) <u>සමාජයීය ව්‍යවසායකත්වය</u>
සමාජයීය මෙහෙවරක් කිරීමේ අරමුණින් සමාජයීය ගැටළු වලට පිළියම් යෙදීමට ව්‍යවසායකත්ව කාර්යයේ නිරතවීම මෙයින් අදහස් කරයි. මානසික තෘප්තිය, පිළිගැනීම, ප්‍රශංසාව, පරෝපකාරය යනාදී ප්‍රතිලාභ මෙමගින් අපේක්ෂා කරයි.

4) <u>ගෝලීය ව්‍යවසායකත්වය</u>
ලෝකයටම තම නිෂ්පාදන ලබා දීම සඳහා වෙළඳාමේ යෙදීම මින් අදහස් කරයි. එනම් ලෝකයේ කුමන ස්ථානයක සිටියද තාක්ෂණය භාවිතයෙන් ලෝකයේ වෙනත් ඕනෑම රටක් හෝ ස්ථානයක් සමග දේශසීමා මායිම් වලින් බැහැරව කටයුතු කිරීමේ හැකියාවයි. ලෝකයේ ඇති විවිධ රටවල විවිධ පුද්ගලයන්ගේ අවශ්‍යතා වලට ගැලපෙන පරිදි තම නිෂ්පාදන ලබා දීම කෙරෙහි මෙහිදී අවධානය යොමු කරයි.


<u>ව්‍යවසායකයා සහ ව්‍යාපාරිකයා</u>

❖ ව්‍යවසායකයා අනිවාර්යෙන්ම ව්‍යාපාරිකයෙකු උවද ව්‍යාපාරිකයා සැමවිටම ව්‍යවසායකයෙකු නොවේ.

| ව්‍යවසායකයා | ව්‍යවසායකයෙකු නොවන ව්‍යාපාරිකයා |
|---|---|
| • තම අදහසක් හා නව සංකල්පයක් අනුව ව්‍යාපාර අරඹයි.<br>• ව්‍යාපාරික ප්‍රතිවාදියා තමා ම ය.<br>• නව ව්‍යාපාර අවස්ථා කෙරෙහි අවධානය යොමු කරයි.<br>• නවෝත්පාදකයෙකි.<br>• අවදානමට මුහුණදෙයි.<br>• ගැටලුවලදී ධෛර්යමත්ව කටයුතු කරයි. | • පවතින අදහසක් හෝ සංකල්පයක් අනුව ව්‍යාපාරය අරඹයි.<br>• අනෙකුත් ව්‍යාපාරික ප්‍රතිවාදීන් සිටියි.<br>• තම ව්‍යාපාර කටයුතු පිළිබඳ පමණක් අවධානය යොමු කරයි.<br>• සාම්ප්‍රදායකයෙකි.<br>• ආරක්ෂාකාරිව කටයුතු කරයි.<br>• ගැටළු වලින් අධෛර්යට පත්වේ. |

ව්‍යවසායකත්ව ක්‍රියාවලිය

**ව්‍යාපාරික අවස්ථා උදාකර ගැනීමත්, ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධාන නිර්මාණය කිරීමත් යනාදී කටයුතුවලදී සිදු කරන්නට යෙදෙන සියළුම ක්‍රියාවන් "ව්‍යවසායකත්ව ක්‍රියාවලිය" ලෙස හැඳින්වේ.**




**1)** නව්‍යතා සම්පාදනය

**ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ ප්‍රථම අදියරයේදී ව්‍යවසායකයා විසින් අදහස් ජනනය කර ගැනීමත්, පරිසර අධ්‍යනය තුළින් අවස්ථා හඳුනා ගැනීමත්, වෙළඳපල අධ්‍යනය කිරීමත් සිදු කරයි.**

**2)** සැලසුම් හා සංකල්ප ගොඩනැගීම

**මෙහිදී ව්‍යාපාර අදහස පැහැදිලි කෙරෙන විස්තරාත්මක වැඩපිළිවෙලක් හෙවත් "ව්‍යාපාර සැලැස්මක්" සකස් කෙරෙයි.**

**3)** සම්පත් සම්පාදනය

**ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය, මානව හා භෞතික සම්පත් හඳුනා ගැනීමත් ඒවා අත්පත් කරගැනීමත් සිදුවේ.**

**4)** යථාර්තයක් බවට පත් කිරීම

**ව්‍යවසායකයා විසින් ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සිදු කරන අතර ව්‍යාපාරයේ අරමුණු ඉටු කරගැනීම සඳහා සම්පත් උපයෝගී කර ගනියි.**

**5)** ප්‍රතිලාභ ලැබීම

**ව්‍යාපාරයේ අනාගත වර්ධනය හා සංවර්ධනය පිළිබඳ තීරණ ගැනීම සිදු කරන්නේ මෙම අදියරේදිය.**

ව්‍යවසායකයා සහ කළමනාකරුවා

**සැම ව්‍යවසායකයෙක්ම කළමනාකරුවෙකි. මන්ද ඔහුගේ ව්‍යවසායකත්ව කාර්ය තුළ කළමනාකරණ කාර්යයන්ද අන්තර්ගත බැවිනි. නමුත් ව්‍යවසායකයෙකු නොවන කළමණාකරුවෙකු අවදානම් දැරීම, නව්‍යතා සම්පාදනය, ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම ආදිය සිදු නොකරයි. එසේම කළමනාකරුවා වැටුපක් අපේක්ෂාවෙන් කටයුතු කරන නමුත් ව්‍යවසායකයා ලාභ අපේක්ෂාවෙන් යුතුව කටයුතු කරයි. ව්‍යවසායකයා බොහෝවිට ව්‍යාපාරයේ අයිතිකරු වුවත් කළමනාකරු ව්‍යාපාරයේ සේවකයෙකි.**

| ව්‍යවසායකත්ව ගතිලක්ෂණ / නිපුණතා | ව්‍යවසායකත්ව කුසලතා |
|---|---|
| **1)** නිර්මාණශීලිත්වය<br>වෙනස් ආකාරයකට දැකීම, සිතීම හා ක්‍රියාකිරීම<br><br>**2)** කැපවීම<br>තම අරමුණු ඉටු කර ගැනීමට දැඩි උනන්දුවකින් කටයුතු කිරීම.<br><br>**3)** ආත්ම විශ්වාසය<br>තමා පිළිබඳ දැඩි විශ්වාසයකින් කටයුතු කිරීම.<br><br>**4)** ස්වාධීන බව<br>වෙනත් අයගේ අදහස් මත යැපෙන්නෙකු නොවී තම අභිමතය, තම හැකියා හා අදහස් අනුව කටයුතු කිරීම<br><br>**5)** අවදානම් දැරීමට ඇති කැමත්ත<br>අවදානම් මගහැරීමට වඩා අවදානම් වලට මුහුණදීමට ඇති කැමත්තයි.<br><br>**6)** නම්‍යශීලි බව<br>නිතර වෙනස්වන ව්‍යාපාරික පරිසරය අනුව සාර්ථකව හැඩගැසීමට ඇති හැකියාව | **1)** නායකත්ව කුසලතා<br>තම ව්‍යාපාරයේ ප්‍රධානියා තමා ය. තම අනුගාමිකයන් ලවා කාර්ය ඉටු කරවා ගැනීමට ඔවුන්ව ධෛර්යමත් කරමින් විධිමත්ව මෙහෙයවිය යුතුය.<br><br>**2)** අන්තර්පුද්ගල කුසලතා<br>භාහිර හා අභ්‍යන්තර පාර්ශ්වයන් සමග මනා සබඳතාවක් පවත්වාගත හැකි වීම.<br><br>**3)** සන්නිවේදන කුසලතා<br>ආයතනයේ අරමුණු ඉටු කරගැනීම සඳහා තොරතුරු භාවිත කිරීමත්, අදාළ තොරතුරු ඵලදායි ආකාරයට සන්නිවේදනය කිරීමත් මෙම කුසලතාවයෙන් අදහස් කරයි.<br><br>**4)** මූලික කළමනාකරණ කුසලතා<br>සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම, පාලනය යන මූලික කළමනාකරණ ශ්‍රිතයන් පිළිබඳ කුසලතා පූර්ණ වීම. |

<u>ව්‍යවසායකත්ව ගතිලක්ෂණ හා කුසලතා වර්ධනය කරගතහැකි ආකාර</u>

**1)** ස්වයං ඇගයීම
එනම් ව්‍යවසායකත්ව නිපුණතා නිශ්චිතව හඳුනා ගැනීම හා තමා තුළ ඒවා කොතෙක් දුරට පවතීද, සංවර්ධනය කර ගත යුතු නිපුණතා මොනවාද යන්න පිළිබඳව තමා විසින්ම තක්සේරුවකට පැමිණීම මෙහිදී සිදුවේ.

**2)** පුහුණුව
ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධනය සඳහා වූ පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම.

**3)** අධ්‍යාපනය
සාමාන්‍ය අධ්‍යාපනයට අමතරව ව්‍යවසායකත්වය පිළිබඳ හැදෑරීම

**4)** අත්දැකීම්
වෙනත් ව්‍යවසායයන් වල කටයුතු කිරීමෙන් හෝ තමාම ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමෙන් ලබන අත්දැකීම්

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

[www.ALNoteBook.com](http://www.ALNoteBook.com)

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

“The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements.”